# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2120/8 - 2019 අප්‍රේල් මස 23 වැනි අඟහරුවාදා - 2019.04.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7(1) වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ යොමු අංකය*: KDS/PDB/4/3/10/(iv).
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය*: 4-3/11/2017/UD/172.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට රජය අදහස් කරන බැවි, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තරය:*

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ පාතදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පල්ලේගම්පහ කෝරළේ සුළු කොට්ඨාසයේ, වළල ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් වෙනුවට මහනුවර ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් මැන පිළියෙල කරන ලද අංක මහ/6911 දරන මූලික පිඹුරේ කැබලි අංක 01 වශයෙන් දැක්වෙන කන්කානියාගේ කුඹුර වනාත නමැති ඉඩමේ මුළු ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0008 ක් පමණ වූ පහත සඳහන් මායිම් තුළ පිහිටි ඉඩම් කොටස.

**කැබලි අංක 1**

ඉඩමේ නම: කන්කානියාගේ කුඹුර වනාත; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0008.

උතුරට : මාර්ගය (මාර්ග සංවර්ධන අධිකාරිය) සහ මුපිමහ 6394 හි කැබලි අංක 61; නැගෙනහිරට : මුපිමහ 6394 හි කැබලි අංක 61, 60 සහ ඩබ්. එම්. පී. එන්. වහින්දර හිමිකම් කියන කන්කානියාගේ කුඹුර; දකුණට : ඩබ්. එම්. පී. එන්. වහින්දර හිමිකම් කියන කන්කානියාගේ කුඹුර සහ කේ. ඒ. එන්. ඩබ්. නානායක්කාර හිමිකම් කියන කන්කානියාගේ කුඹුර වනාත; බටහිරට : කේ. ඒ. එන්. ඩබ්. නානායක්කාර හිමිකම් කියන කන්කානියාගේ කුඹුර වනාත සහ ඇළ;

හිමිකම් කියන්නන්ගේ නම් හා ලිපිනයන් : කේ. ඒ. එන්. ඩබ්. නානායක්කාර, නො. 174, 8 කණුව, වළල, මැණික්හින්න.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් 2019 මැයි මස 29 වැනි දින පෙ.ව. 10.00 ට පාතදුම්බර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුයි.

තවද, 2019 මැයි මස 22 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය. හිමිකම් කීම පිළිබඳ ඔප්පු ආදිය පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතුය.

ඩී. ජී. සී. ජයතුංග,
ප්‍රාදේශීය ලේකම්,
පාතදුම්බර.

2019 අප්‍රේල් මස 10 වැනි දින,
පාතදුම්බර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

05-93

1A - G 29908 - 12 (2019/04)
ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.